**මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 1 - 2014**

**----------------------------------------------------------------------**

මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - 1 හි 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන සංවර්ධන බැංකු සහයෝගීතාවය අතර 2010 දෙසැම්බර් 16 දින එළඹි අංක 4500402212010110492 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා කාලය**

**----------------------------------------------------------------------**

මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය-1 හි ණය ගිවිසුමට අනුව, වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, එවකට මහා මාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉදිකිරීම් කොන්ත්‍රාත් යටතේ සැලසුම් කළ පරිදි ප්‍රමුඛ මාර්ග වැඩි දියුණු කිරීම හා ප්‍රතිසංස්කරණය ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු. මිලියන 18,864 කට සමාන එ.ජ.ඩො. මිලියන 169.8 ක් වූ අතර එයින් රු. මිලියන 16,976 කට සමාන එ.ජ.ඩො. මිලියන 152.8 ක් චීන සංවර්ධන බැංකුව විසින් ලබාදීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 දෙසැම්බර් 29 ආරම්භ කළ අතර 2013 දෙසැම්බර් 29 අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත් ව්‍යාපෘති කාලය 2014 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල

සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරීක්ෂා කිරීම්ද පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළදී හා 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු.මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
| වි.සං.බැ. | 152.8 | 16,976 | 4,315.68 | 27.29 | 3,563.56 | 139.65 | 17,025.17 |
| ශ්‍රී.ලං.ර | 17.0 | 1,888 | 385.93 | - | 385.93 | - | 2,368.95 |
| | **169.8** | **18,864** | **4,701.61** | **27.29** | **3,949.49** | **139.65** | **19,394.12** |

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව, දිස්ත්‍රික්ක 04 ක මාර්ග 08 ක ප්‍රතිසංස්කරණ වැඩ හා හම්බන්තොට සිරිබෝපුර මංසන්ධියේ ගුවන් පාලම ඉදිකිරීමේ වැඩ 2014 දෙසැම්බර් 31 දිනට සැලකිය යුතු ලෙස අවසන් කර තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දුර්වල තත්ත්වයේ ද්‍රව්‍ය භාවිතය හා වැසි කාලයේ වැඩ සිදුකිරීම නිසා පරන්තන් - මුලතිව් මාර්ගයේ කිලෝමීටර 49+500 සිට කිලෝමීටර 49+570 දක්වා ස්ථානය හා කිලෝමීටර 51+450 සිට කිලෝමීටර 51+638 දක්වා ස්ථානවල ගල් කුඩු එලීම, තැලීම මූලික ආලේපනය හා මාර්ග සලකුණු ප්‍රශස්ථ මට්ටමේ නොපැවතුනු බව විගණකවරුන් විසින් සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂණයේදී අනාවරණය විය.

(ආ) ගල්කුඩු කොන්ක්‍රීට් කිරීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත් ලියවිලිවල තාක්ෂණික පිරිවිතර අංක 506.5 (එ) අනුව, තලන ලද මාර්ග තලයෙන් ලබා ගන්නා සියළු සාම්පලවල ඝනකම පැවතිය යුතු ඝනකමෙන් සියයට 98 කට වඩා අඩු නොවිය යුතුය. කෙසේ වෙතත් පැලවත්ත- තිනියාවල-කන්කොටියාවත්ත-මොරවක මාර්ගයේ ස්ථාන 43 ක ගල්කුඩු කොන්ක්‍රීට් තැලීම අවශ්‍ය මට්ටමට නොපැවතුණි. කොන්ක්‍රීට් පරීක්ෂණ වාර්තා අනුව, කොන්ක්‍රීට්වල ශක්තිය මැනීමට පරික්ෂා කළ හැරුම් සාම්පල 281 න් හැරුම් සාම්පල 123 ක් ප්‍රශස්ත මට්ටමේ පැවතුණි. තවද පරීක්ෂණ වාර්තා අනුව, මාර්ගයේ බෝක්කු 04 ක කොන්ක්‍රීට් වැඩවල තත්ත්වයේ අඩුපාඩු ද වාර්තා වී තිබුණි. පරීක්ෂණ වාර්තා වලින් අනාවරණය වූ අඩුපාඩු පිළිසකර කිරීමට කඩිනම් පියවර ගැනීමට කොන්ත්‍රාත්කරු වෙත නේවාසික ඉංජිනේරු උපදෙස් නිකුත් කර තිබුණද, අඩුපාඩු පිළිසකර කිරීමට කොන්ත්‍රාත්කරු විසින් කටයුතු කළ බවට තහවුරු කර ගැනීමට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

### 3.4 මතභේදාත්මක ක්‍රියාකාරකම්

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති කටයුතුවල ඍජුවම නියැලී නොමැති පරිගණක ක්‍රියාකරුවකු හා රියදුරෙකු වෙත ව්‍යාපෘතිය විසින් එකතුව රු. මිලියන 2.26 ක වැටුප් හා දීමනා සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

(ආ) ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, පරන්තන් - මුලතිව් මාර්ගයේ ඉදිකිරීම් වැඩ 2013 දෙසැම්බර් 21 දින අවසන් කර තිබුණි. කෙසේ වෙතත් රු. මිලියන 173.11 ක් හා රු.මිලියන 37.76 ක් වටිනා විචලතා නියෝග 02 ක් සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතිය විසින් අනුමත කර ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාර්ග සංවර්ධන අධිකාරියේ හා ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ ඉල්ලීම මත, මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් 17 දෙනෙකු මධ්‍යම ඉංජිනේරු හා උපදේශක කාර්යාංශයට අනුයුක්ත කර තිබුණු අතර එකතුව රු. මිලියන 47.42 ක පාරිශ්‍රමික විචලතා නියෝග යටතේ ගෙවා තිබුණි.

(ii) එයට අමතරව, ව්‍යාපෘතියට අනුයුක්ත කර ඇති මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් වෙත වැටුප් හා දීමනා වශයෙන් රු. මිලියන 9.66 ක් විධිමත් අනුමැතියකින් තොරව තවත් විචලතා නියෝගයක් යටතේ ගෙවා තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුවන් වෙත අතුරු ගෙවීම් පියවීමේ ප්‍රමාදයන් හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවල 14.8 වගන්තිය ප්‍රකාරව කොන්ත්‍රාත් 6 ක් සඳහා රු. මිලියන 29.16 ක් වටිනා අමතර ගාස්තු ගෙවා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතිය විසින් රු. 810,053 ක පිරිවැයකට මිලදී ගත් පරිගණකයක්, පරිගණක උපාංග, කාර්යාල පහසුකම් හා ඩිජිටල් කැමරාවක් අනෙකුත් ආයතනවල භාවිතය සඳහා ලබා දී තිබුණි.

## 3.5 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය අනුමත කර තිබුණද, අනුමත සේවක මණ්ඩලයට වඩා වැඩියෙන් උපදේශකයින් 03 ක් බඳවා ගෙන රු. මිලියන 1.62 ක් වූ පාරිශ්‍රමික සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. එම උපදේශකයින්ගේ වැඩ පැවරීමේ කොන්දේසි විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස මෙම උපදේශකයින්ගෙන් ව්‍යාපෘතියට වන දායකත්වය විගණනයේදී නිශ්චය කිරීමට නොහැකි විය.